අගනකුත් ශීර්ෂ වෙනුවෙන් වර්ධනකරණ ආයතනය විසින් අක්තිකාරම් "බී" ගිණුම් වෙතුවෙන් කරන ලද බැර කිරීම්	22,256,468	
අගනකුත් ශීර්ෂ විසින් අක්තිකාරම් "බී" ගිණුම්වේ කරන ලද හර කිරීම්	145,280	191,489,357
2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		2,015,515.459

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

ජී.එන්.ජී. පතිරණ
ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය :-

රු.,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1003 -07-02	රෙජිස්ට්‍රාර් ගාස්තු	-	-	19,863.72	
1003-07-03	දැව ප්‍රවාහන ගාස්තු	-	-	768.82	
1003-07-05	බලපත්‍ර ගාස්තු	-	-	628.22	
1003-07-09	කාබන් බද්ද	-	--	53.09	
1003-07-99	අනෙකුත් ගාස්තු	5,150.00	3,800.00	2,967.27	78. 1%
2002-01-01	රජයේ ගොඩනැගිලි කුලී	-	-	5,183.13	
2002-01-03	ඉඩම් හා අනෙකුත් බදු කුලී	-	-	1,994.09	
2002-02-99	ණය පොළී - වෙනත්	5,570.00	5,980.00	6,177.24	103. 1%
2003-02-13	විභාග හා අනෙකුත් ගාස්තු	-	-	13.80	
2003-02-14	මෝටර් රථ - අනෙකුත් ගාස්තු	-	-	51,410.88	
2003-02-03	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	-	-	5,138.40	
2003-02-99	විවිධ ලැබීම්	150.00	150.00	189.52	126%
2003-03-02	දඩ මුදල් හා රාජ සන්තක කිරීම්	30.00	25.00	24.10	96.4%
2003-99-00	අනෙකුත් ලැබීම්	5,000.00	5,000.00	17,617.20	352%
2004-01-00	සමාජ සංරක්ෂණ දායක මුදල්	-	-	50,510.62	
2006-02-01	ප්‍රාග්ධන වත්කම් විකිණීම - වාහන	-	-	6,129.09	
2006-02-02	ප්‍රාග්ධන වත්කම් විකිණීම - අනෙකුත්	-	-	279.95	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය :-

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	671,172,000	669,000,000	521,483,757.89	78 %
ප්‍රාග්ධන	1,293,684,000	271,000,000	132,623,163.26	49%

3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන :-

රු.,000

වැය ශීර්ෂය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව/	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
101	බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය		1,394.65	1,394.65	1,283.28	92
102	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය		885.84	885.84	868.68	98
103	ආරක්ෂක අමාත්‍යාංශය		57,357.16	57,357.16	51,905.04	90
110	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය		18,383.27	18,383.27	14,031.22	76
111	සෞඛ්‍ය අමාත්‍යාංශය		12,213.81	12,213.81	11,046.01	90
118	කෘෂිකර්ම අමාත්‍යාංශය		438,290.80	438,290.80	378,319.09	86

122	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය		29,889.25	29,889.25	28,264.85	94
126	අධ්‍යාපන අමාත්‍යාංශය		6,120.26	6,120.26	3,787.82	61
130	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය		495,495.90	495,495.90	450,298.59	90
135	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය		79.03	79.03	77.49	98
149	කර්මාන්ත අමාත්‍යාංශය		10,261.91	10,261.91	10,187.76	99
160	පරිසර අමාත්‍යාංශය		22,016.06	22,016.06	7,724.91	35
171	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය		650,511.16	650,511.16	601,113.27	92
186	තාක්ෂණ අමාත්‍යාංශය		351.39	351.39	227.03	64
189	මහජන ආරක්ෂක අමාත්‍යාංශය		725.77	725.77	697.50	96
193	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය		1,823.60	1,823.60	1,270.60	69
194	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය		15,202.47	15,202.47	12,457.04	81
198	වාරිමාර්ග අමාත්‍යාංශය		1,816.81	1,816.81	1,054.03	58
201	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව		14,996.23	14,996.23	13,744.02	91
202	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව		426.00	426.00	400.00	93
206	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව		2,741.41	2,741.41	2,592.43	94
210	ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව		247.86	247.86	154.52	62
216	සමාජ සේවා දෙපාර්තමේන්තුව		12,476.06	12,476.06	11,633.81	93
217	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව		2,005.80	2,005.80	1,960.09	97
219	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව		444.80	444.80	374.61	84
227	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව		14,244.38	14,244.38	13,649.97	95
237	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව		118,603.07	118,603.07	73,166.45	61
243	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව		19,373.00	19,373.00	13,929.30	71
252	ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව		1,179.83	1,179.83	1,073.99	91
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව		11,499.90	11,499.90	11,343.84	98
282	වාරිමාර්ග දෙපාර්තමේන්තුව		220.00	220.00	220.00	100
284	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව		8,008.00	8,008.00	6,568.73	82
285	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව		1,392.00	1,392.00	1,391.88	99
286	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව		10,827.26	10,827.26	14,478.29	133
303	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව		2,968.50	2,968.50	2,838.00	95

307	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව		977.00	977.00	1,061.01	108
326	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව		15.00	15.00	10.50	70
327	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව		833.11	833.11	872.69	104
328	මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව		1,012.57	1,012.57	693.92	68
334	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව		434,280.07	434,280.07	408,473.82	94
422	දහම් පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය		12,982.35	12,982.35	10,763.32	82

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය :-

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	1,334,147,950.09	-	
9152	යන්ත්‍රෝපකරණ	-	367,621,021.04	-	
9153	ඉඩම්	-	701,790,000.00	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව :-

ඇමුණුම - I

පරිච්ඡේදය 04
කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව):-

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% -74%
වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම.	99.7		
ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම. (අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම්)	115		
අනවසර ඉඩම් සඳහා විධිමත් බලපත්‍ර හා දීමනා පත්‍ර ලබාදීම.	84.6		
උප්පැන්න,විවාහ හා මරණ සහතික නිකුත් කිරීම.	140		
ව්‍යාපාර නාම ලියාපදිංචිය.	123.6		

පරිච්ඡේදය 05
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු :-

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% -74%	75% - 100%
සියලු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.	දරිද්‍රතා අනුපාත 20.8 සිට 15 දක්වා අවම කිරීම.	2022 වසරේ දරිද්‍රතා අනුපාතය 5.8 කි.		72.1	
	දරිද්‍රතාවයෙන් පෙළෙන ගෘහ ඒකක ප්‍රතිශතය 18.8% සිට 12% දක්වා අවම කිරීම.	2022 වසරේ දරිද්‍රතාවයෙන් පෙළෙන ගෘහ ඒකක ප්‍රතිශතය 4.4% කි.		74.5	
සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාව සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකාර්මය ප්‍රවර්ධනය කිරීම.	ඒක පුද්ගල ශක්ති පරිභෝජනය දිනකට කිලෝ කැලරි 2,216 සිට 2,250 දක්වා ඉහළ නැංවීම.	2022 වසරේ ඒක පුද්ගල ශක්ති පරිභෝජනය දිනකට කිලෝ කැලරි 2,302 කි.	37		
පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම.	අ.පො.ස. උසස්පෙළ සඳහා සුදුසුකම් ලබන සිසුන් සංඛ්‍යාව 25% කින් ඉහළ නැංවීම.	අ.පො.ස. සා.පෙළ සඳහා පෙනී සිටි සිසුන් 7,547 දෙනෙකුගෙන් සිසුන් 5,709 දෙනෙක් සුදුසුකම් ලබා ඇත.			75.64
	විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන් සංඛ්‍යාව 25% කින් ඉහළ නැංවීම.	අ.පො.ස. උසස් පෙළ සඳහා පෙනී සිටි සිසුන් 5,867 දෙනෙකුගෙන් සිසුන් 3,868 දෙනෙක් සුදුසුකම් ලබා ඇත.		65.92	
සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම.	පිරිසිදු පානීය ජලය ලබා ගන්නා ගෘහ ඒකක සංඛ්‍යාව 10% කින් ඉහළ නැංවීම.	2022 වර්ෂයේ දී පිරිසිදු පානීය ජලය ලබා ගන්නා ගෘහ ඒකක සංඛ්‍යාව 158,838 කි. (මුළු ගෘහ ඒකක 165,498)			97.29
	සනීපාරක්ෂක පහසුකම් සහිත ගෘහ ඒකක සංඛ්‍යාව 10% කින් ඉහළ නැංවීම.	2022 වර්ෂයේ දී සනීපාරක්ෂක පහසුකම් සහිත ගෘහ ඒකක සංඛ්‍යාව 154,609 කි. (මුළු ගෘහ ඒකක 165,498)			93.42

සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය,තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම.	විදුලි බලය භාවිත කරනු ලබන ගෘහ ඒකක සංඛ්‍යාව 90% ක් දක්වා ඉහළ නැංවීම.	2022 වර්ෂයේ දී විදුලි බලය භාවිතා කරනු ලබන ගෘහ ඒකක සංඛ්‍යාව 161,379 කි. (මුළු ගෘහ ඒකක 165,498)			97.51
සියල්ලන් සඳහා පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	සේවා වියුක්ති අනුපාතය 6.5% සිට 5% දක්වා අවම කිරීම.	2022 වර්ෂයේ සේවා වියුක්ති අනුපාතිකය 6.5% කි.	6.5		

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග :-

අනු අංකය	ජයග්‍රහණ	අභියෝග
01.	දරිද්‍රතා මට්ටම සමස්තයක් ලෙස පහළ දැමීමට හැකි වීම.	ප්‍රාථමික නිෂ්පාදන පමණක් සිදුවන අතර අගය වැඩි කිරීමේ නිෂ්පාදනය ඉතා අවම වේගයකින් වර්ධනය වීම.
02.	උසස් අධ්‍යාපන සඳහා යොමුවන ප්‍රමාණය ඉහළ නැංවීමට හැකි වීම.	පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා අවම වීම.
03.	ගෘහ ඒකකයන්හි මූලික අවශ්‍යතා ඉහළ ප්‍රතිශතයකින් සපුරාලීමට හැකි වීම.	ව්‍යත්තිය අවශ්‍යතා පිළිබඳ පවතින අඩු අවධානය.
04.	-	කුඩා ව්‍යවසායකත්වය සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය මහා පරිමාණ ව්‍යවසායකත්වය ලෙස වර්ධනය නොවීම.
05.	-	කන්න බෝග වගාවෙන් වාණිජ කෘෂිකර්මාන්තය වෙත ප්‍රජාව ඉලක්කගත කිරීම දුෂ්කර කාර්යයක් වීම.
06.	-	වියළි කාලගුණ තත්වයන්හිදි කෘෂිකර්මාන්තයට හා පරිභෝජනයට අවශ්‍ය ජලය ප්‍රමාණවත් නොවීම.
07.	-	කෘෂි අස්වනු සඳහා නිසි මිලක් නොලැබීම.
08.	-	අලි මිනිස් ගැටුම් ඉහළ යාම.

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය :-

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂඨ	59	46	13
තෘතීයික	41	12	29
ද්විතියික	1186	1165	111
ප්‍රාථමික	120	101	19

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද යන්න :-

*ඇතැම් පුරප්පාඩු තනතුරු වල රාජකාරී කටයුතු දැනට සේවයේ නියුතු නිලධාරීන් හට පවරා ඇති බැවින් එදිනෙදා රාජකාරී කටයුතු අපහසුතාවයකින් තොරව ඉටුකරවා ගැනීමට හැකියාව ලැබී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය :-

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වාභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය නිලධාරී රාජකාරි ධාරිතා සංවර්ධන වැඩසටහන	74	මාස 01	55,250.00	-	දේශීය	ධනාත්මක ප්‍රජා සබඳතා වර්ධනය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ මෘදු කුසලතා වර්ධනය
මූලික පරිගණක පුහණු වැඩසටහන	28	දින 03	-	-	දේශීය	නිලධාරීන් සතු තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය තුළින් සේවය කාර්යක්ෂම වීම.

කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා ඵලදායිතා සංකල්ප පිළිබඳ පුහුණු වැඩසටහන	200	දින 02	50,000.00	-	දේශීය	කාර්යක්ෂම හා සඵලදායී රාජ්‍ය සේවයක් ස්ථාපිත වීම.
පශ්චාත් උපාධි පාඨමාලාව - ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලය	1	අවුරුදු 01	265,000.00	-	දේශීය	සේවය කාර්යක්ෂම වීම.
විශ්‍රාම වැටුප් හා සමාජ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිළබඳ පුහුණු වැඩසටහන	4	දින 04	-	-	දේශීය	විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ දැනුම වර්ධනය වීම.
ග්‍රාම නිලධාරි රාජකාරි සඳහා ආශ්‍රිත නෛතික විධිවිධාන පිළිබඳ ග්‍රාම නිලධාරීන් හා ඊට අදාළ ආජකාරි සිදුකරන නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	28	දින 01	30,775.00	-	දේශීය	එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ රාජකාරී සිදු කිරීම පිළිබඳ නිලධාරීන්ගේ දැනුම වර්ධනය හා මහජන සේවය කාර්යක්ෂම වීම.
ගෙවතු වගා හා ස්වයංපෝෂිත ගම්මාන නිර්මාණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	90	දින 01	41,050.00	-	දේශීය	වසම් තුළ ගෙවතු වගා සංවර්ධනය වීම.

පරිච්ඡේදය 07
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වයන් (අනුකූල වේ/ නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	√		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	√		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නැත.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නැත.		
1.6	වෙනත්	අදාල නැත.		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.2	පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගලික පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්ගෙන යාම	√		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්ගෙන යාම	√		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	√		
2.6	චෙක්පත් හා මුදල් ඇණුවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්ගෙන යාම	√		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	√		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	√		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	√		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	√		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	√		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	√		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	√		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව , රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	√		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	√		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	√		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තුමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	√		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	නැත		නියමිත දිනට පිලිතුරු ඉදිරිපත් කිරීමට නිලධාරීන් දැනුවත් කිරීම.

6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134 (2) DMA/1-2019 අනුව , වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	නැත		මාසයක් ඇතුලත සියළුම විගණන විමසුම් වලට පිලිතුරු ඉදිරිපත් කිරීමට නිලධාරීන් දැනුවත් කිරීම හා විගණන විමසුම් ඇති නොවන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කර තිබීම	√		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	√		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	√		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	√		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	√		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා ආදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	√		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	√		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	√		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	√		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	√		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103 , 104 ,109 , හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	√		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම.	√		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	√		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	√		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හා ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	√		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	√		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	√		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද	√		

	ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට ඵලඹීම			
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	√		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	√		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	නැත	මියගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට නීතිපති උපදෙස් ඉල්ලා ඇත.	නීතිපති උපදෙස් ලබා ගැනීම. පළාත් සභා ශේෂ මාසිකව නිරවුල් කිරීම.
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීම	නැත	ඇතැම් විගණන විමසුම් සිදුවන බැවින් තවදුරටත් රඳවා ගෙන තිබේ.	මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීම.
13.2	පොදු තැම්පත් සඳහා වන පාලන ගිණුම් යාවත්කාලින කර පවත්වාගෙන යාම	√		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	√		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	√		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	√		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	√		
15.2	රැස්කළ තිබූ ආදායම් තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	√		

15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	√		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	√		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	√		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	√		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	√		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	√		
18	**පුරවැසි ප්‍රඥප්තියේ ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	√		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	√		

19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	√		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	√		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	√		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛනයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	√		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම	√		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරැදි කොට තිබීම	නැත		විගණන කළමනාකරණ කමිටු වෙත අදාළ ගැටලු යොමු කිරීම.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } යූපීසීජී/එම්ජී/ඒ/ඩීඑස්/ඒජීආර්/2022 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 24 දින

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
29 MAY 2023
ගිණුම් අංශය

ගණන් දීමේ නිලධාරී,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

FM/CH
25/25

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.එම්.ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත්:- 01. ලේකම් - ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

02. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

යූපිසිජී/එමජී/ඒ/ඩීඑස්/ඒජීආර්/2022

ගණන් දීමේ නිලධාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

ශීර්ෂය 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 විගණන මතය

ශීර්ෂය 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා

දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ඡේදයට යොමුව
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පුනරාවර්තන හා මූලධන වියදම් ස්ථාවර වත්කම්	1.6.1 හා 1.6.3ඡේද
මුදල් ප්‍රවාහ ප්‍රකාශය, තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම්	1.6.1.3 ඡේද

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන හා මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් වැය ශීර්ෂයන් 59 කට අදාළව රු.36,243,028 ක් වැය කර තිබූ එම වියදම සඳහා වැයලෙජර් පවත්වා නොතිබුණු අතර දෙපාර්තමේන්තු ගිණුම් සාරාංශ හා වැය ලෙජරයන් අතර ඇස්තමේන්තු ප්‍රතිපාදනයේ වැය ශීර්ෂ 127 ක එකතුව රු.154,191,583 ක්ද, මුළු වියදමේ වැය ශීර්ෂ 40 ක එකතුව රු.70,727,302 ක්ද, වෙනස්කම් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ රු.2,403,558,971 ක් වුවත්, ඉදිරිපත්කර ඇති උපලේඛනය අනුව එම ශේෂයරු.2,403,947,171 ක් වූ අතර, අපහරණය කළ රු.388,200 ක් වූ ස්ථාවර වත්කම් උපලේඛනයෙන් ඉවත් කර දක්වා නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
තණමල්විල හා කතරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාල - රජයේ ඉඩමක් ලබා ගැනීමට සුදුසු තැනැත්තන් ලියාපදිංචි කිරීමේ ලේඛනය	2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 1.3.4 ඡේදය	ලේඛනය පවත්වා නොතිබුණි.
මොණරාගල හා කතරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාල - ඉඩම් කොටසක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ ලේඛනය	2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 1.3.4 ඡේදය	ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

1.6.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව උපරිම වියදම් සීමාව රු.35,000,000 ක් වුවත්, දෙපාර්තමේන්තු පොත් අනුව රු.35,395,000 ක් වූ අතර උපරිම වියදම් සීමාව රු.395,000 ක් ඉක්මවා තිබූ අතර ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) පළාත් සභා ආයතනයක ස්ථාන මාරුවී ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.102,719 ක් වූ අතර එම ණය ශේෂ වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂයක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මිය ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය එකතුව රු. 1,210,053 ක් වූ අතර, ඉන් එකතුව රු.1,011,393 ක් වූ ණය ශේෂ 02 ක සිට වර්ෂ 05 ට අධික කාලයක් සිට අය නොවී පවතින ණය ශේෂ විය.

(ඇ) විශ්‍රාම ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂය රු.1,335,479 ක් විය.

(ඉ) වැඩ තහනම් කර ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂය එකතුව රු. 682,896 ක් වූ අතර, ඉන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.324,479 ක ණය ශේෂය වසර 05 කට වඩා පැරණි ණය ශේෂ විය.

(ඊ) සේවය අතහැර ගොස් තිබුණු නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය එකතුව රු.244,522 ක් වූ අතර, එම ණය ශේෂ වර්ෂ 05 කට අධික කාලයක සිට අයවිය යුතු ණය ශේෂයන් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් සහ බැදීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂය අවසානයට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවිය යුතුව වෙනත් දීමනා රු.19,000 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ සටහන් අංක (iv) යටතේ ඉදිරිපත් කර ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුලත් කර නොතිබුණි.

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලද රු.60,284,140 ක ප්‍රතිපාදන මත සියඹලාණ්ඩුව සූර්ය විදුලි උත්පාදනාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.51,879,639 ක වටිනාකමකට ඈන්හෝ ඉංජිනියරින් පුද්ගලික සමාගම සමඟ 2022 අගෝස්තු 03 දින ගිවිසුම් අත්සන්කර තිබුණි. විගණිත දිනය වූ 2023 පෙබරවාරි 17 දින වන විට අදාළ කොන්ත්‍රාක්කාර සමාගමට රු.27,659,353 ක් ගෙවීම් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ඉහත කොන්ත්‍රාත්තුව 2022 දෙසැම්බර් 29 දිනට පෙර නිමකළ යුතු වුවත්, සාධාරණ හේතුවකින් තොරව ඉතිරි ඉදිකිරීම් කාර්යයන් සිදු කිරීමට කටයුතු නොකර කර්මාන්තය අතරමඟ නවතා දමා තිබුණු බව 2023 පෙබරවාරි 16 වන දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) (i) පරිසර හා වනජීවී අමාත්‍යාංශයේ 2020 ජනවාරි 03 දිනැති පරිසර චක්‍රලේඛ අංක 01/2020 අනුව 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 වැනි වගන්තියට අනුකූල නොවන ලෙස බොරළු කැපීමේ වලංගු කැණීම් බලපත්‍රයක් ලබාගෙන නොතිබියදී වැල්ලවාය හා මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ව්‍යාපෘති 2 ක් සඳහා රු.2,228,190 ගෙවා තිබුණි.

(ii) 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 44 වන වගන්තියට අනුව මොණරාගල හා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යාපෘති 2 කට අදාළව කැනීම් බලපත්‍රයක් ලබා නොගැනීම හේතුවෙන් රු.9,450 ක් රජයට අයවිය යුතු රාජ්‍ය භාග ආදායම අහිමි වී තිබුණි.

(ඇ) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2020 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.1,992,285 ක් වැයකර තිබුණු අතර, ගොඩනැගිල්ල ඉදිකර වසර 2 ක කාලයක් ගත වී තිබුණද, විගණන දිනය වූ 2022 නොවැම්බර් 15 දින වන විටත් අරමුණුගත කාර්යන් සඳහා යොදාගැනීමට සැලැස්මක් නොතිබුණු අතර මසකට වරක් ආයුර්වේද වැඩසටහනක් පැවැත්වීම පමණක් සිදුකර ඌන උපයෝජිතව තිබුණි.

(ඈ) මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ වෙහෙරයාය රන්ලිය ව්‍යවසායකත්වය සංවර්ධන පදනම සඳහා රටකජු සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට 2020 ඔක්තෝම්බර් 14 දින රු.1,925,569 ක වටිනාකමට ග්‍රාමීය වැඩිහිටි සංවිධානයක් වෙත පවරා වැඩ අවසන් කර තිබූ අදාළ ගොඩනැගිල්ල විගණන දිනය වූ 2022 නොවැම්බර් 15 දින වන විට වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද, අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි.

(ඉ) සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ නේවාසික ගෘහ ආර්ථික වැඩසටහන යටතේ 2021 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබුණු රු.37,799 ක් වූ අගල් 2 ක විදුලි වතුර මෝටරය, ප්‍රතිලාභියෙකු වෙත ලබාදී තිබුණද විගණන දිනය වූ 2022 නොවැම්බර් 10 දින වන විටත් අරමුණු ගත කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

(ඊ) සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 පෙබරවාරි 10 දිනැති අංක 2021/01 දරන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන පිහිටුවීම මඟින්, ජාතික නිෂ්පාදනය වැඩිකිරීම, ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා විකල්ප ආදායම් මාර්ග ඇතිකිරීම, විරැකියාව අඩුකිරීම, දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරීම වැනි අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කර තිබුණද, වැල්ලවාය හා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.5,479,380 ක් වැයකර උපකරණ මිලට ගෙන බෙදාදීම පමණක් සිදුකර තිබුණද ව්‍යාපාතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(උ) සමෘද්ධි හා අඩු ආදායම් ලාභී පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ නේවාසික ගෘහ ආර්ථික වැඩසටහන යටතේ කතරගම හා මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රතිලාභීන් 7 දෙනෙකු වෙත රු.266,630 ක් වටිනා උපකරණ හා ද්‍රව්‍යාධාර ලබාදී තිබුණු අතර, 2022 දෙසැම්බර් මස වන විටත් එම උපකරණ අරමුණුගත කාර්ය සඳහා යොදවා නොතිබුණි.

(ඌ) 2021 වර්ෂයේ එක් වසමකට එක් ව්‍යවසායකයෙක් බීහි කිරීමේ වැඩසටහන යටතේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 9 දෙනෙකු වෙත රු.54,950 ක් වටිනා ධාන්‍ය ඇඹුරුම් යන්ත්‍ර 9 ක් ලබාදීම සඳහා රු.494,910 ක් වැයකර තිබුණද, අදාළ ඇඹරුම් යන්ත්‍ර ඉතා කුඩා ප්‍රමාණයේ ඒවා වූ අතර එක් වරකට ඇඹරිය හැක්කේ ග්‍රෑම් 50 ක පමණ ප්‍රමාණයක් බැවින් ඇඹරුම් ද්‍රව්‍ය යන්ත්‍රයේ ඉහළ කොටසින් හා පහළ කොටසින් ඉවතට විසිවන නිසා ධාන්‍ය අපතේ යාමක් සිදුවන බැවින්, ප්‍රතිලාභීන් විසින් ව්‍යාපාරික මට්ටමින් ධාන්‍ය ඇඹරීමේ ව්‍යාපාරයන් පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි.

(එ) රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඌව වෙල්ලස්ස භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ 2019 අගෝස්තු 19 දින මිලදී ගෙන තිබුණු රු.19,500,000 ක් වටිනා භාණ්ඩ හා උපකරණ ඒකක 5216 ක් දුෂ්කර පළාත්වල අඩු පහසුකම් සහිත ප්‍රජාව සවිබල ගැන්වීමේ අරමුණින් මිලදීගෙන තිබුණි. අදාළ ද්‍රව්‍ය හා ආධාර නියමිත පරිදි භාරදීම හා ඒවා අදාළ කාර්ය සඳහා යොදාගත් බවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රතිලාභියා සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු අතර අදාල උපකරණ අරමුණුගත කාර්ය සඳහා භාවිතා කරන්නේ ද යන්න පසුවිපරම් කිරීමක්ද කර නොතිබුණි.

(ඒ) මුදල් ආර්ථික ස්ථීයිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ලෝක ආහාර වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත බඩඉරිඟු වගාව දිරි ගැන්වීම සඳහා රු.8,910,000 ක් ගෙවා තිබුණි. ගොවීන් තෝරාගැනීම සඳහා නිශ්චිත නිර්නායක සකස්කර නොතිබීමත්, බඩඉරිඟු වගාව ආරම්භ කර මසකට පසු පුහුණු වැඩසටහන් පැවැත්වීමත්, ව්‍යාපෘතියේ අරමුණ වූ තෝරාගත් ගොවීන් 275 දෙනෙකු වෙත බීජ හා අනෙකුත් යෙදවුම් සඳහා රු.30,000 බැගින් වූ අඩු මුදලක් ලබාදීමත් නිසා අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
		රු.	
(අ)	රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් නිකුත් කර ඇති අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක 21/1596/304/134 හා 2021 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය,	7,756,578	මොනරාගල හා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වල ව්‍යාපෘති වල සාර්ථකත්වය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලැබුණු ප්‍රතිපාදන එම ගම්මාන වල ප්‍රතිලාභීන්ට අවශ්‍ය පහසුකම් සැපයීමක් සිදු නොකර වෙනත් අතුරු මාර්ග 06 ක් සංවර්ධනය කිරීම සඳහා වැයකර තිබුණි.
(ආ)	1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස සන්තකය ආපසු ගැනීමේ පනත		ගිවිසුම්ගත කාලය අවසන් වුවද, නැවත භාර නොදුන් රජයේ නිවාස 03 ක් යොමුගත පනතේ රෙගුලාසි ප්‍රකාරව නැවත පවරා ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

i මුදල් රෙගුලාසි 8 (4) (i) වගන්තිය	64,299	මූලධන වියදම් හා පුනරාවර්තන වියදම් ලෙස වැය විෂයයන් කාණ්ඩ ගත කර ප්‍රමිතිකරණය කරනු ලැබ ඇති අතර, ඒවා වෙනස් නොකළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවස්ථා 05 කදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ රජයේ නිවාසය සඳහා උපකරණ මිලදී ගැනීමේදී යොමුගත රෙගුලාසි වලට අනුකූල නොවන ලෙස ගිණුම්ගත කර තිබුණි.
ii.මුදල් රෙගුලාසි 104 (4)	541,250	අලාභ හානි සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කලයුතු බව දක්වා තිබුණ ද 2021 හා 2022 වර්ෂයේ සිදු වී තිබුණු වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.
iii.මුදල් රෙගුලාසි 206 (1)	1,204,667	තැන්පත් ගෙවීම් සඳහා සෑම වවුවරයක්ම නිළධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ නිළධාරීන් දෙදෙනෙකු සහතික නොකර 2022 ජුනි 30 දින වවුවර් අංක 308 මඟින් ගෙවා තිබුණි.
iv .මුදල් රෙගුලාසි 237 (අ) (i) හා (ආ)	11,738,374	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කතරගම හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මිලදී ගැනීම් සඳහා ගෙවීම් කිරීමේදී කාර්යාල වෙත ලැබී නොතිබුණු භාණ්ඩ සඳහා ගෙවීම් කර තිබුණි.
v .මුදල් රෙගුලාසි 571	8,651,465	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාළව වර්ෂ දෙකක් ඉක්ම වූ තැන්පතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් නියාදනය කර නොතිබුණි.
vi .මුදල් රෙගුලාසි 751	669,530	මොණරාගල හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලැබුණු භාණ්ඩ ඒකක 542 ක් බඩු ලේඛන පොතේ ඇතුළත් කර නොතිබුණි.
vii .මුදල් රෙගුලාසි 799 (1)	362,320	යොමුගත විධිවිධානවලට අනුකූල නොවී වැල්ලවාය හා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනට අදාළව භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කාර්යපරිපාටියෙන් බැහැරව කටයුතු කර තිබුණි.

	viii .මුදල් රෙගුලාසි 1646		ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාළ වාහන 30 ක 2022 වර්ෂයට අදාල ධාවන සටහන් 2023 පෙබරවාරි 28 දින වන විටත් විගණන සඳහා ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** ----------		
	xix වැනි පරිච්ඡේදයේ 6.2 ඡේදය	36,000	රජයේ නිවාසයක් රජයේ නිලධාරියකුට පමණක් වෙන්කර දියහැකි වුවද, ඊට අනුකූල නොවී වරිපනම් අංක 28/49 දරන රජයේ නිවාසය 2017 සැප්තැම්බර් 25 දින සිට මාසිකව රු.3,000 ක කුලියකට තාවකාලික පදිංචිය සඳහා පුද්ගලික ආයතනයක සේවය කරන ඉංජිනේරුවරයෙකුගේ පදිංචිය සඳහා ලබා දී තිබුණි.
(ඈ)	2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය		දෛනික ධාවන සටහන් වෙනුවට චක්‍රලේඛයේ ඇමුණුම 02 පරිදි සටහනක් පවත්වාගෙන යා යුතු වුවත්, නිල වාහන 5 ක් සම්බන්ධයෙන් එම සටහන් පවත්වා නොතිබුණි.
(ඉ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1 ඡේදය		ආයතනයේ කාර්යමණ්ඩලයේ කාර්යසාධනය ඉහල නංවා ගැනීම සඳහා ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සිදුකළ යුතු වුවද, 2021 හා 2022 වර්ෂවලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඊ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ----------		
	8.9.1 (ආ) ඡේදය	48,664,675	වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වැල්ලවාය, කතරගම, මොණරාගල හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉහත වැඩ වටිනාකම ඉක්මවූ මිලදී ගැනීම් වලදී විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

	1.3.2. වගන්තිය	3,076,820	උපකරණ මිලට ගැනීම සඳහා මිල ගණන් කැඳවීම ආයතන 05 කින් සිදුකළ බවත්, ඉන් එක් සැපයුම්කරුවකු පමණක් මිල ගණන් එවා තිබුණු බවත් ප්‍රසම්පාදන තීරණයේ දක්වා තිබුණද, මිල ගණන් යැවූ බවට සඳහන් කර තිබුණු අනෙකුත් ආයතන 04 හි සැපයුම්කරුවන් සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂාවේදී, සැපයුම්කරුවන් තිදෙනෙකු කිතුල් ආශ්‍රිත නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ සැපයීමක් සිදු නොකරන ආයතන බවත්, එක් ආයතනයකට මිල ගණන් කැඳවීම් ලිපි ලැබී නොමැති බවත් නිරීක්ෂණය විය.
(ඩ)	2020 මාර්තු 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 35	51,800,044	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ භාණ්ඩ ප්‍රසම්පාදන කටයුතු සඳහා අධිකාරී සීමාව රු.මිලියන 1 ක්ද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සැපයුම් කටයුතු සඳහා අධිකාරී සීමාව රු.මිලියන 10 ක් වුවද, එම සීමාව ඉක්මවා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වැල්ලවාය, කතරගම ,මොණරාගල හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් උපකරණ මිලට ගැනීම උපකොටස් වලට බෙදා සිදුකර තිබුණි.
(ඪ)	2018 ජූලි 09 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 34	110,290	ආයතන ප්‍රධානියා විසින් බලය පවරනු ලැබූ ප්‍රාදේශීය ප්‍රධානියෙකුට සෘජු මිලදී ගැනීම් ලෙස භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ සීමාව දිනකට රු.15,000 ක් ලෙස දක්වා තිබුණද, එම සීමාව ඉක්මවා භාණ්ඩ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේ ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රන්දෙනිගොඩයාය ප්‍රජා ශාලාව අසල ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා වූ කර්මාන්තය 2021 මාර්තු 01 දින රු.1,504,095 ක වටිනාකමකට ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත පවරා ඉටු කරවාගෙන තිබුණු අතර, ඉදිකිරීම් නිමකර වසරකට අධික කාලයක් ගත වී තිබුණද, ක්‍රීඩා පිටිය ප්‍රාදේශීය සභාව වෙත භාරදී භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අගය එකතු කල නිෂ්පාදන ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ ධාන්‍ය ආශ්‍රිත, පලතුරු ආශ්‍රිත නිෂ්පාදන ආරම්භ කිරීම හා අලෙවිසැලක් ආරම්භ කිරීම වෙනුවෙන් මිලදී ගෙන තිබූ එකතුව රු.521,958 ක් වූ උපකරණ 14 ක් අරමුණුගත කාර්යයන් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 හා 2022 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කෝමාරිකා වගා ව්‍යාපෘතිය සඳහා රු.3,776,390 ක් වැය කර තිබුණි. කෝමාරිකා පැල මිලදී ගෙන ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා රු.1,697,090 ක් වැය කර තිබුණද, කෝමාරිකා පත්‍ර නිෂ්පාදනයේ අස්වනු නෙලීමේ කාලය එළඹ තිබුණද, පත්‍ර ඵලදාව මිලදී ගැනීමට ගැනුම්කරුවන් නොමැතිවීමෙන් හා සරු ඵලදාවක් නොතිබීමෙන් වගාකරුවන් වගාව අත්හැර දැමීමට නැඹුරු වී තිබුණි. තවද දිලීර රෝග වැලදී කෝමාරිකා පත්‍ර විනාශවී යන ස්වරූපයක් පවතින බව සංවර්ධන නිලධාරී වාර්තා හා ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ පවතින අරමුදල් පරීක්ෂාවේදී 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශ 11 ක් තුළ ග්‍රාමශක්ති ජනතා සමිති 125 ක් පැවති අතර එම සමිති සතු බැංකු ගිණුම් හි රු.81,968,386 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ සමිති 125 ක් වෙනුවෙන් රු.5,092,310 ක් වැය කර තිබුණත් එම ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබූ නිෂ්පාදන ව්‍යාපාර ක්‍රියාත්මක කර නොතිබුණි. තවද බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මිණිපුරගම කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය මඟින් ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබූ ණය මුදල් වලින් ප්‍රතිලාභීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.396,211 ක ණය මුදල 2023 පෙබරවාරි 01 දින වන විටත් අයකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩිහිටි දීමනා හා ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ දීමනා ගෙවීමේදී රු.1,101,900 ක් ප්‍රතිලාභීන් වෙත ලබා නොදී 2022 දෙසැම්බර් 31 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ආපසු එවා තිබුණි.

(ඊ) එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන යටතේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ප්‍රතිලාභීන් 66 දෙනෙකු සඳහා විසුරුම් ජල පද්ධති මිලදී ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.29,252,633 ක් වැයකර තිබුණි. වගා බිම් සඳහා විදුලි පහසුකම් නොමැති ප්‍රතිලාභීන් තෝරාගෙන විදුලි ජල මෝටර් ලබාදීමෙන්ද, ප්‍රතිලාභීන්ට විශාල වගාබිම් තිබියදී අක්කර 0.25 ක් සඳහා විසිරි ජල පද්ධති ලබාදීමෙන් විශාල වගා බිම් සඳහා අවධානය අඩුවෙන් යොමු වීමෙන්ද, වන සතුන් බහුල ප්‍රදේශවල වගා බිම් තිබීමෙන් විසිරි ජල පද්ධති ස්ථිරව සවිකර තබාගත නොහැකි වීමෙන්ද, වගකිවයුතු නිළධාරීන් පසුවිපරම් නොකිරීමෙන්ද, අදාළ උපකරණ ඵලදායිව යොදා ගන්නා බවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රතිලාභීන් අතර ලිඛිත ගිවිසුමකට ඇතුළත් නොවීමෙන්ද, ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(උ) ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් 302 දෙනෙකුට මහකන්නයේ වගා කිරීම සඳහා මුං හා උඳු බීජ කිලෝග්‍රෑම් 2754 ක් මිලදී ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.2,889,120 ක් වැය කර තිබුණි. නියමිත කාලය ප්‍රමාද වී බීජ ලබාදීම නිසා තණමල්විල හා සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රතිලාභීන් 80 දෙනෙකු රු.331,170 ක් වටිනා මුං හා උඳු බීජ කිලෝග්‍රෑම් 317.265 ක් භාවිතයට ගෙන නොතිබුණි. තවද රු.37,463 ක් වටිනා උඳු හා මුං බීජ කිලෝග්‍රෑම් 36.25 වගාකලද වර්ධනය බාල වී තිබුණි.

(ඌ) ඌව වෙල්ලස්ස භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ මිලදී ගෙන තිබුණු රු.382,076 ක් වටිනා භාණ්ඩ හා උපකරණ ඒකක 96 ක් 2023 පෙබරවාරි 23 දින වන විටත් බෙදානොහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ රඳවාගෙන තිබුණි.

(එ) එක් ග්‍රාම නිළධාරී වසමකට එක් කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහි කිරීමේ වැඩසටහන - 2021 යටතේ රතුපස්කැටිය බිබිල පදිංචි ප්‍රතිලාභියකු වෙත ලබාදී තිබූ රු.150,000 ක් වටිනා ධාන්‍ය හා කුළු බඩු ඇඹරුම් යන්ත්‍රය ප්‍රතිලාභියා සතුව නොපවතින බව 2023 මාර්තු 08 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ඒ) මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මිලදීගෙන 2021 විමධ්‍යගත වැඩසටහන යටතේ කරාඩුගල ප්‍රජාමූල සංවිධානය වෙත බෙදාදීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලද ප්ලාස්ටික් පුටු 20 ක් විගණන දිනය වූ 2023 මාර්තු 07 දින වන විටත් බෙදා නොහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගබඩාවේ ගොඩගසා තිබුණි.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

සාම්ප්‍රදායික සහ ග්‍රාමීය කර්මාන්ත ගම්මාන සංවර්ධන ඒකාබද්ධ වැඩසටහන - 2021 යටතේ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොලොන්වින්න පන් කර්මාන්ත ගම්මානයක් සංවර්ධනය කිරීම සඳහා රු. 2,390,641 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතිය යටතේ රු. 853,000 ක් ඇස්තමේන්තු කර පන් කර්මාන්ත ශිල්පින්ගේ නිර්මාණ අලෙවිහලක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණද, විගණන දිනය වූ 2022 දෙසැම්බර් 20 දින වන විටත් අදාළ ඉඩම මැනුම් කිරීම සඳහා ඉල්ලීම් කිරීම පමණක් සිදුකර තිබුණි. තවද වැඩහල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ද්‍රව්‍යාධාර ලබාදුන් ප්‍රතිලාභීන්ගේ ඉදිකිරීම් පිළිබඳ 2022 දෙසැම්බර් 20 දින සිදුකළ නියැදි පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 4 දෙනෙකු ඉදිකිරීම් නිම කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය සිදුකොරේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන ලේඛනයේ ඇතුළත්ව නොමැති වාහන 06 ක් අනතුරුවීම හෝ වෙනත් හේතූන් මත 2020 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර කාර්යාල පරිශ්‍රය තුළ විනාශ වෙමින් පැවතුණ අතර, නිලධාරී වෙත භාර දී තිබූ යතුරුපැදි 06 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ආපසු භාරදීමෙන් පසු එම යතුරුපැදිවල කොටස් අස්ථානගතව තිබුණි.එම කරුණු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ලේඛනගත ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන 08 ක් සම්බන්ධයෙන් වර්ෂ 06 ක කලයක සිට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව නිවාස කුලී අඩුවෙන් අය කිරීම හේතුවෙන් නිලධාරීන් 58 දෙනෙකුට අදාළව රු.708,030 ක් වූ නිවාස කුලී 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් හිඟව පැවතුණි.

(ආ) කතරගම, මොණරාගල සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2019 සිට 2022 වර්ෂය දක්වා විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ මිලදී ගෙන තිබුණු රු.1,588,473 ක් වටිනා භාණ්ඩ ඒකක 1411 ක් විගණන දිනය වූ 2022 දෙසැම්බර් මස වන විටත් අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 22 දින වන විට මොණරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂ වල සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු බලපත්‍ර (අවසර පත්‍ර) 69 ක්ද, 2014 වර්ෂවල සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු දීමනා පත්‍ර 50 ක් ද අදාළ දීමනාපත්‍ර/බලපත්‍ර ලාභීන්ට ලබාදීමට කටයුතු නොකර කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ඉ) වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 29 හි බලපත්‍ර ඉඩම් සඳහා දීමනා පත්‍ර 2543 ක් සකස් කිරීමට අදාළව, 2015 සිට 2019 වර්ෂවල මොනරාගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී කාර්යාලය වෙත මැනුම් ඉල්ලීම් ලිපි යවා තිබුණ ද, 2022 නොවැම්බර් 15 දින වන විටත් එම කටයුතු සිදු වී නොතිබුණු අතර ඒ සඳහා එම ඉල්ලීම් ලිපි යැවූ දිනයෙන් පසු, පසුවිපරම් කටයුතු හෝ සිහිකැඳවීම් ලිපි යවා නොමැති බව නිරීක්ෂණය විය.

(ඊ) බුත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාමිකයන් දහදෙනෙකු සඳහා එකතුව රු. 2,084,790 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, එම මුදලින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් තවදුරටත් රු.1,168,365 ක් අයවිය යුතුව තිබුණි.

(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත් වාහන 10 ක් 2022 වර්ෂයේදී ධාවනය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඌ) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2016 ජූලි 14 දිනැති සියලු ප්‍රාදේශිය ලේකම්වරු අමතන ලද ලිපිය අනුව ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය (e-slim) යටතේ ඉඩම් පිළිබඳ දත්ත 2016 ඔක්තෝබර් මස අවසාන වන විට අවසන් කළයුතු බවට ඉලක්ක ලබා දී තිබුණත් , කතරගම ප්‍රදේශීය ලේකම් කාර්යාල විසින් 2015 වර්ෂයෙන් පසුවත් මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2016 වර්ෂයෙන් පසුවත් මෙම පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ) 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනතට අදාළ නියෝග අංක 179 අනුකූලව අස්කිරීමේ දැන්වීමකින් බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩම් 03 ක ඉඩම් නිරවුල් සන්තකය ලබා ගැනීමට විගණන දිනය වූ 2023 ජනවාරි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යා විස්තරය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 06 ක්, තෘතීයික ශ්‍රේණියේ තනතුරු 04 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 06 ක්ද වශයෙන් තනතුරු 16 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක අනුමත සේවක සංඛ්‍යා විස්තරය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 08 ක් ද තෘතීයික ශ්‍රේණියේ තනතුරු 15 ක්, ද්විතීයික ශ්‍රේණියේ තනතුරු 156 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 11ක්ද වශයෙන් තනතුරු 190 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යා විස්තරය අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක ද්විතීයික ශ්‍රේණියේ සේවකයින් 215 ක්ද, ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් 02 ක්ද අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා අතිරික්තව පැවතුණි.

(ඈ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම තනතුරේ/සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවද, මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 30 දෙනෙකු සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක සේවයේ නියුතු නිලධාරීන් 896 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දින වන විටත් වසර 06 සිට වසර 32 ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී සිට තිබුණි.

කේ.එම්.ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත්:- 01. ලේකම් - ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

02. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව